26 · 07 · 2016

Learning Resource Center

මීගමුව අධ්‍යාපන කලාපය

**දෙවන වාර ඇගයීම - 2016**

**නර්තනය (දේශීය) I, II**

කාලය පැය 03 යි.

විභාග අංකය: ..............................................

| 10 ශ්‍රේණිය | I කොටස |
| --- | --- |

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. ආතත වාද්‍ය භාණ්ඩයක් උපයෝගී කරගෙන රංගනය කරන නැටුම් විශේෂයක් වනුයේ,
    (1) ලී කෙළි නැටුමයි. (2) තාලම් නැටුමයි.
    (3) පන්තේරු නැටුමයි. (4) රබන් නැටුමයි.

02. "රටකට මව් සමගින් නැව් නැග......." මෙහි මුළු මාත්‍රා සංඛ්‍යාව වනුයේ,
    (1) 15 කි. (2) 16 කි.
    (3) 20 කි. (4) 14 කි.

03. මූලික සරඹ අභ්‍යාසයක් ලෙස දොඹින පද නටනු ලබන්නේ,
    (1) උඩරට සම්ප්‍රදායේ ය. (2) පහතරට සම්ප්‍රදායේ ය.
    (3) සබරගමු සම්ප්‍රදායේ ය. (4) භරත සම්ප්‍රදායේ ය.

04. මේවා ත්‍රිවිධ ලය අනුව නැටිය හැකිය.
    (1) වන්නම් සහ වට්ටම් (2) ගොඩ සරඹ සහ වන්නම්
    (3) පා සරඹ සහ ගොඩ සරඹ (4) පා සරඹ සහ වන්නම්

05. එකොළොස් වන ගොඩ සරඹයට අදාළ කස්තිරම වනුයේ,
    (1) තත් තක්කඩ ජිත් ජිත්කඩ............. (2) තක්කඩ කඩතක ජිජිකුඳ...........
    (3) රුංතක ජිංතක තරිකිට කුඳත්.......... (4) තත් තත් තක්කඩ කඩතක............

06. දොං දොංජිං ජිං ගජි ගත බෙර පදය වාදනය කළ හැක්කේ,
    (1) සුළු මැදුම් දෙතිතට ය. (2) සුළු මහ දෙතිතට ය.
    (3) මැදුම් මහ දෙතිතට ය. (4) සුළු තනි තිතට ය.

07. සිංහරාජ වන්නම සඳහා ..................... බෙරපදය වාදනය කළ හැකිය.
    (1) කුඳගත ගතදොම් (2) දොමිකිට තකුදොං
    (3) තකුංජිං ජිංගත (4) දොදොංත තකුදොං

08. ප්‍රස්තාරකරණයේ දී දෙතිත සඳහා යොදා ගන්නා තාල සංඥා පිළිවෙළින්,
    (1) / ∧ ය. (2) ∧ / ය.
    (3) / / ය. (4) ∧ ∧ ය.

09. සටන් ජයග්‍රහණ සහ ආගමික කටයුතු සඳහා භාවිත කළ වාදන විශේෂයන් මෙසේ ය.
    (1) රණබෙර වාදනය සහ හේවිසි වාදනය (2) අණබෙර වාදනය සහ මළ බෙර වාදනය
    (3) රණබෙර වාදනය සහ අණබෙර වාදනය (4) හේවිසි වාදනය සහ අණබෙර වාදනය

10. දුරත් බැලුම නොව ලඟත් බලන අය................. මෙම ගී පාදයේ ඉතිරි කොටස වනුයේ,
(1) විරත් කලෙක පැවතුමක් යසයි හැඩ .........ය. (2) හටත් මෙලෙස වෙයි කැටත් තබම් දඩ..... ය.
(3) රටක් වටින සිහරජ වන්නමෙ හැඩ.......... ය. (4) වටත් අයට දනෙනටත් කියම් මම......... ය.

● අංක 11 සිට 15 දක්වා පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| පේළිය | I තීරුව | II තීරුව | III තීරුව | IV තීරුව |
|---|---|---|---|---|
| A | යක් බෙරය | උඩැක්කිය | කර පටිය | කයිමෙත්ත |
| B | හනුමා | නෛයඩි | සිංහරාජ | තුරඟා |
| C | නෙත්ති මාලය | දෙවුර මාලය | දවුල | ගැට බෙරය |
| D | ආවැන්දුම | තෙල්මෙ නැටීම | දොළහ පෙළපාලිය | දලුමුර පිදීම |

11. "තාම් දොමිතිගත දොමිකිත............" මෙම අඩව්ව භාවිත කළ හැකි වන්නම් දෙක ඇතුළත් වනුයේ,
(1) B පේළියේ II හා IV තීරුවල ය. (2) B පේළියේ I හා IV තීරුවල ය.
(3) B පේළියේ I හා III තීරුවල ය. (4) B පේළියේ III හා IV තීරුවල ය.

12. දෙවොල්මඩු ශාන්ති කර්මයේ නාට්‍යමය පෙළපාලි අංගයක් දක්වනුයේ,
(1) D පේළියේ I තීරුවේ ය. (2) D පේළියේ III තීරුවේ ය.
(3) D පේළියේ II තීරුවේ ය. (4) D පේළියේ IV තීරුවේ ය.

13. වෙස් ඇඳුම් කට්ටලයේ වෙස් තට්ටුවට අයත් කොටසක් දක්වනුයේ,
(1) A පේළියේ IV තීරුවේ ය. (2) A පේළියේ III තීරුවේ ය.
(3) C පේළියේ I තීරුවේ ය. (4) C පේළියේ II තීරුවේ ය.

14. ඉල්ලම් යොදා සාදා ඇති අවනද්ධ භාණ්ඩය දක්වනුයේ,
(1) A පේළියේ I තීරුවේ ය. (2) A පේළියේ II තීරුවේ ය.
(3) C පේළියේ III තීරුවේ ය. (4) C පේළියේ IV තීරුවේ ය.

15. එක් වියතක් පමණ දිගැති ආතත වාදන භාණ්ඩය කුමක් ද?
(1) යක්බෙරය (2) උඩැක්කිය
(3) දවුල (4) ගැට බෙරය.

16. හැටපස් මංගල්‍යය ශාන්ති කර්මයේ දැකිය හැකි නාට්‍යමය අවස්ථාවකි.
(1) අඹ විදමන (2) දෙවොල් ගොඩ බැසීම
(3) දරු නැලවිල්ල (4) ඌරා යක්කම

17. කෝළම් හා සොකරි රඟ මඩල
(1) ත්‍රිකෝණාකාර ය (2) හතරැස් ය.
(3) ඉලිප්සාකාර ය. (4) කවාකාර ය.

18. පහතරට නර්තන ශිල්පියා පපුවට පළඳිනු ලබන්නේ,
(1) බුබුළු පටියයි. (2) පබළු පටියයි.
(3) තෙල් කච්චියයි. (4) අවුල් හැරයයි.

19. "තහලම් කළ බෙර තම්මැට පට තන්තිරි ඩමරු............" යනාදී වශයෙන් සඳහන් වනුයේ,
(1) තිසර සංදේශයේ ය. (2) මයුර සංදේශයේ ය.
(3) පරවි සංදේශයේ ය. (4) ගිරා සංදේශයේ ය.

20. පිළිවෙළින් පන්තේරු, හක්ගෙඩිය, දඬු බෙරය, යන වාද්‍ය භාණ්ඩ පංචතූර්ය වාදනයේ දී...................... යන කොටස්වලට අයත් වේ.
(1) ආතත, ඝණ, සුසිර (2) ඝණ, සුසිර, විතත
(3) ඝණ, විතත, සුසිර (4) ආතත, ඝණ, විතත

21. උඩරට සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයේ, දකුණු ඇස වැසීම සඳහා යොදා ගන්නා ආරක්ෂිත වැස්ම හඳුන්වනු ලබන්නේ,
(1) කැපුම් හම යනුවෙනි. (2) බෙර වැසුම යනුවෙනි.
(3) හයි තට්ටුව යනුවෙනි. (4) සුරත් තට්ටුව යනුවෙනි.

22. සැස්සේරුව සෙල් ලිපිය ......................යුගයේ නර්තන කලාව ප්‍රචලිතව පැවති බවට සාධක ලබා ගත හැකි ලිඛිත මූලාශ්‍රයකි,
(1) පොළොන්නරු (2) අනුරාධපුර
(3) කෝට්ටේ (4) ගම්පල

23. දෙවුන්දර දේවාලයේ හින්දු බාළිකාවන් පන්සියයක් දෙනා නර්තනයේ යෙදුන බව සඳහන් කර ඇති දේශ සංචාරකයා වනුයේ,
(1) රොබට් නොක්ස් ය. (2) ස්පිල් බර්ජන් ය.
(3) ඉබන් බතූතා ය. (4) පාහියන් භික්ෂුව ය.

24. තත්, ජිත්, තොං, නං යනු,
(1) පළමු ගොඩසරඹ කස්තිරම් පදය ය. (2) ගැටබෙරයෙන් උපදින මූලික අක්ෂර ය.
(3) පළමු බෙර සරඹය ය. (4) බෙර නමස්කාර පදය ය.

25. සොකරි නාටකය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වනුයේ,
(1) ස්වාභාවික විපත් සහ වසංගත රෝග දුරු කිරීමයි.
(2) අපල උපද්‍රව දුරු කිරීමයි.
(3) නවග්‍රහ ශාන්තිය සහ විනෝදාස්වාදයයි.
(4) විනෝදාස්වාදය සහ සශ්‍රීකත්වයයි.

26. "ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ............" මෙම ගී පාදය ගයනු ලබන්නේ,
(1) සොකරිය සඳහා ය. (2) වෙදරාල සඳහා ය.
(3) ගුරුහාමි සඳහා ය. (4) පරයා සඳහා ය.

27. "කරදිය" මුද්‍රා නාට්‍ය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවනුයේ,
(1) පණිභාරත මහතාට ය. (2) චිත්‍රසේන මහතාට ය.
(3) ශේෂා පලිහක්කාර මහතාට ය. (4) ඉඹුල්ගොඩ මහතාට ය.

28. "මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ" ගී ඛණ්ඩය ඇතුළත් වේදිකා නාට්‍යය වනුයේ,
(1) චාල්ස් ඩයස් මහතාගේ විදුර නූර්තියයි. (2) බන්දුල ජයවර්ධන මහතාගේ බෙර හඬ ය.
(3) ජයලත් මනෝරත්න මහතාගේ ගුරු තරුවයි. (4) බන්දුල ජයවර්ධන මහතාගේ විදුර නූර්තියයි.

29. නර්තන කලාවෙන් ලැබෙන මානසික ස්වස්ථතාවයේ ප්‍රතිඵලයකි.
(1) අලංකාර පද නැටීමට හැකිවීම. (2) විවිධ ප්‍රසංග නැරඹීමට යොමුවීම.
(3) සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් වීම. (4) ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීමට හැකිවීම.

5419

30. උඩරට ප්‍රධාන ශාන්තිකර්මය වන කොහොඹා කංකාරියට කියන තවත් නමකි,
   (1) වලියක් මංගල්‍ය ය. (2) හැටපස් මංගල්‍ය ය.
   (3) කඩවර මංගල්‍ය ය. (4) නානුමුර මංගල්‍ය ය.

31. සොකරි නාටකයේ එන සොකරිගේ ස්වාමි පුරුෂයා වනුයේ,
   (1) වෙදරාල ය. (2) පරයා ය.
   (3) ආඬිගුරා ය. (4) සොත්තානා ය.

32. දහඅට වන්නම රචනා කරන ලද්දේ,
   (1) මහනුවර යුගයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දවස ය.
   (2) මහනුවර යුගයේ වික්‍රමබාහු රජ දවස ය.
   (3) දඹදෙනි යුගයේ දෙවන පරාක්‍රමබාහු රජු දවස ය.
   (4) මහනුවර යුගයේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු දවස ය.

33. ගැටබෙරය හා සම්බන්ධ කොටස් කිහිපයකි,
   (1) සුරත් තට්ටුව, කැපුම්හම, බෙර පුහුල (2) සුරත් තට්ටුව, වරපටි, ඉල්ලම් මුදු
   (3) හයි තට්ටුව, හැක්ම, බෙර පුහුල (4) හයි තට්ටුව, සුරත් තට්ටුව, කැපුම්හම

34. දොං ජිංත ගත දොංත වට්ටම නටනුයේ,
   (1) සුළු මහ දෙතිතට ය. (2) සුළු මැදුම් දෙතිතට ය.
   (3) මැදුම් මහ දෙතිතට ය. (4) මැදුම් තනි තිතට ය.

35. සැවුලා වන්නමට අයත් කස්තිරම කුමක් ද?
   (1) කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා (2) දොං ජිංත දොං තා
   (3) කුඳ ගජිගත කුඳ ගජිගත කුඳ ගජිගත කුඳතා (4) තත් ජිත් තොංනං තා

36. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සෑදීමට උපයෝගී කර ගන්නේ,
   (1) ඇහැළ, කොහොඹ, ගංසූරිය වැනි දැව වර්ග ය. (2) ඇහැළ, මිල්ල, පොල් වැනි දැව වර්ග ය.
   (3) ඇහැළ, කොස්, කිතුල් වැනි දැව වර්ග ය. (4) කිතුල්, පොල්, මිල්ල වැනි දැව වර්ග ය.

37. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ඇතුළත් ගායනා සහිත නර්තන අංග කීපයකි.
   (1) නානුමුරය, කුවේනි අස්න (2) කුවේනි අස්න, කොහොඹ හැල්ල
   (3) මඩුපුරය, යක් ඇනුම (4) කුවේනි අස්න, ගබඩා කොල්ලය

38. හිස, ඇස්, දෙඅත්, දෙපා, කඳ යනුවෙන් දැක්වෙන්නේ,
   (1) පද පහත්තියයි. (2) මූලික අංගහාරයයි
   (3) පංචවිධ අභිනයයි (4) නළු පංචාංගයයි.

39. නර්තනයේ වේගය මනින මිනුම් දණ්ඩ .................... නමින් හැඳින්වේ.
   (1) ලය (2) තිත
   (3) ලඝු (4) මාත්‍රා

40. "මාත්‍රා 123 + 1234" මෙම තාල රූපයෙන් දැක්වෙන්නේ,
   (1) මැදුම් තනි තිත ය. (2) මැදුම් මහ දෙතිත ය.
   (3) සුළු මහ දෙතිත ය. (4) සුළු මැදුම් දෙතිත ය.

Learning Resource Center

26-07-2016

මීගමුව අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2016

නර්තනය (දේශීය) I , II

විභාග අංකය: ..................................................

| 10 ශ්‍රේණිය | II කොටස |
|---|---|

**උපදෙස්**

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. i. "නන් උතුම් පෙම්බර ගුණ" මෙම කවිය මාත්‍රා .......................... තාලයට ගායනා කළ හැකිය.

ii. සමගිය, සහයෝගය දක්වෙන මුද්‍රා නාට්‍යයක් ලෙස ............................ නම් කළ හැකිය.

iii. සරඹ අභ්‍යාස නර්තනය කළ යුත්තේ ................................... ලය අනුවයි.

iv. ධීවර කර්මාන්තය, පතල් කර්මාන්තය ආදිය ........................................................ පදනම් කරගත් කර්මාන්ත වේ.

v. දොළොස්වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ ............................................. ය.

vi. පහතරට ඉලංගම් සරඹ, සබරගමු සම්ප්‍රදායේ දී ................................... යනුවෙන් ව්‍යවහාර වේ.

vii. වන්නම් නැටීමේ දී බොහෝවිට දැකිය හැකි වන්නේ ......................................... අභිනයයි.

viii. උඩරට සම්ප්‍රදායට අයත් උපදේශාත්මක වන්නමක් ලෙස හැඳින්විය හැක්කේ ...................... වන්නම ය.

ix. "හතික වරෙව් කොල්ලනේ" ගීතයේ නිර්මාණ ශිල්පියා කවුද? එය ගයනු ලබන්නේ කවුරුන් විසින් ද?

x. අතීතයේ සන්නිවේදන කාර්යය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කළ අවස්ථා 02ක් නම් කරන්න.

(ල. 12)

02. දේශීය අනන්‍යතාවය සහ ග්‍රාමීයත්වය මනාව පිළිබිඹු වන්නේ ගැමි නාටක තුළින් බව නොරහසකි.

i. දේශීය ගැමි නාටක නම් කරන්න. (ල. 03)

ii. ඉන් එක් ගැමි නාටකයක් ප්‍රචලිත ප්‍රදේශ 02ක් හා එය පැවැත්වීමේ හේතු 02ක් දක්වන්න. (ල. 02)

iii. ගැමි නාටක අභාවයට යා නොදී සංරක්ෂණය කර ගත හැකි ක්‍රම 03ක් ඉදිරිපත් කරන්න. (ල. 03)

iv. ගැමි නාටකයකට අදාළ කවියක් පද ප්‍රස්තාර කර දක්වන්න. (ල. 04)

නර්තනය

03. වංශ කථා හා විදේශිකයින්ගේ වාර්තාවලින් නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකිය.

i. ආගමික හා සමාජීය අවශ්‍යතා සඳහා නර්තනය යොදා ගැනීම පිළිබඳ කරුණු ඉදිරිපත් කළ විදේශිකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

ii. ඉන් එක් අයෙකු සඳහන් කර, ඔහුගේ දේශාටන වාර්තාව ඇසුරින් නර්තන කලාව හා සම්බන්ධ සුවිශේෂී කරුණු ලියා දක්වන්න. (ල. 04)

iii. මහා වංශයේ සාධක ඇසුරින් නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු අයුරු විස්තර කරන්න. (ල. 05)

04. සංගීතය, රංගවස්ත්‍රාභරණ, වේදිකා, සැරසිලි, ආලෝකකරණය ආදිය යොදාගෙන කලාත්මක මුද්‍රා නාට්‍ය නිර්මාණය කිරීම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ දැකිය හැකි කරුණකි.

i. කරදිය හෝ කුඹී කතාව මුද්‍රා නාට්‍යයට පසුබිම් වූ කතා පුවත කෙටියෙන් ලියන්න. (ල. 04)

ii. ඔබ තෝරාගත් මුද්‍රා නාට්‍යයේ තේමාව විකාශනය සඳහා නර්තනය යොදාගෙන ඇති ආකාරය විස්තර කරන්න. (ල. 04)

iii. එහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

05. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය භාණ්ඩ උපයෝගී කරගනිමින් සන්නිවේදන කාර්යය සාර්ථකව සිදු කළ හැකිය.

i. ඔබ දන්නා සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 03 ක් හා විකල්ප වාද්‍ය භාණ්ඩ 03 ක් නම් කරන්න. (ල. 03)

ii. සමාජීය හා ආගමික අවශ්‍යතා සඳහා සන්නිවේදන කාර්යයේ දී ඉහත වාදන භාණ්ඩ යොදාගත් අවස්ථා 03 බැගින් වගු ගත කරන්න. (ල. 03)

iii. සන්නිවේදන කාර්ය සඳහා යොදා ගත් ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් ඇඳ කොටස් 04ක් නම් කරන්න. (ල. 06)

06. පහත සඳහන් කරුණු 03ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

| | |
|---|---|
| i. ශාන්තිකර්ම | ii. ගැමි නැටුම් |
| iii. වන්නම් | iv මන්ඩිය |
| v. අවකාශ භාවිතය | vi. ගැට බෙරය (ල. 4 X 3) |

07. i. මාත්‍රා 2+4 ට අදාළ වන බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 02)

ii. ඔබ උගත් තුන්තිතේ ප්‍රභේද 2ක් නම් කර මාත්‍රා තුනේ (3) තනිතිතට අයත් ජන ගීයක් ප්‍රස්තාර කරන්න. (ල. 05)

iii. සිංහරාජ වන්නමේ කවියක් සහ අඩව්ව ප්‍රස්තාර කරන්න. (ල. 05)